**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2015 වර්ෂය**

ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 23 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 731.64 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 726.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 4.65 ක් හෙවත් සියයට 0.64 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 653.99 | 649.34 | 4.65 | 0.71 |
| මූලධන | 77.65 | 77.65 | - | 0 |
| **එකතුව** | **731.64** | **726.99** | **4.65** | **0.64** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 19ක් විසින් එකතුව රු.මිලියන 2,147.53 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 2,030.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 116.54 ක් හෙවත් සියයට 5.42 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 49.00 | 47.04 | 32.00 | 40.58 | 120.00 | 113.12 |

### 2.2.2 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වන අංක 7000/0000/00/0282/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 12,712,291 ක් වී තිබුණි.

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 08කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 126,842,705 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0090/000 | 90,000 |
| 6000/0000/00/0013/0059/000 | 38,688,453 |
| 6000/0000/00/0014/0006/000 | 693,000 |
| 6000/0000/00/0016/0041/000 | 62,197,327 |
| 6000/0000/00/0017/0012/000 | 3,722,240 |
| 6000/0000/00/0018/0053/000 | 52,686 |

| | |
|---|---:|
| 6000/0000/00/0019/0008/000 | 6,020,120 |
| 6000/0000/00/0020/0002/000 | 15,378,879 |
| | --------------- |
| **එකතුව** | **126,842,705** |
| | ======== |

## 2.4 විගණන නිරීක්ෂණය

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එහි ආදායම් ගිණුම් 2016 මාර්තු 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 ඔක්තෝබර් 10 දින වන විටත් එම ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඇතැම් වාර්තා විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| | **ලේඛණ වර්ගය** | **අදාළ රෙගුලාසිය** | **නිරීක්ෂණය** |
|---|---|---|---|
| (i) | පොත් නාමාවලිය | 5:9 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත | පවත්වා නොතිබුණි. |
| (ii) | දුරකථන ලේඛණය | මුදල් රෙගුලාසි 845(1) හා 846(3) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iii) | ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (iv) | පරිගනක, උපාංග හා මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 06ක් සඳහා සලසා තිබුණු සත්‍ය ප්‍රතිපාදනය රු.7,204,000 ක් සියයට 22 සිට සියයට 66 ක් දකවා අවස්ථා 06 කදි අඩුකර තිබුණු අතර තවත් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සියයට 12.8 සිට සියයට 141.2 ක් දක්වා වැඩිකර තිබුණු බවත් නිරීක්ෂණය විය. මූල්‍ය පාලන සැලසුමකින් තොරව අයවැය ඇස්තමේන්තුව පිළියළ කර තිබුණු බව මේ අනුව නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 07 ක් අතර සියයට 08 සිට සියයට 66 ක් වූ රු.6,254,000 ක ප්‍රතිපාදන ඉතිරි වීම් මාරු කිරීම් සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

## 3.4 අග්‍රිම ගිණුම්

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව, ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය සම්පූර්ණ කළ වහාම නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 02 කදි නිකුත් තළ එකතුව රු. 25,000ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය අවසන් වී මාස 08 සිට මාස 10 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

පහත් සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් කාර්යයන් 31 ක් සඳහා ලබාදුන් රු. 1,077,385 ක්වූ ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ආ) සේවක වැටුප්, ප්‍රසාද දීමනා, අතිකාල, විදුලිය වියදම්, ගමන් වියදම් සහ දූරකථන ගාස්තු ආදි වූ විවිධ වියදම් රු. 5,322,485 ක් දැරීමෙන් පසුව මාර්ග බලපත්‍ර මඟින් රැස් කරනු ලැබූ රු. 32,378,590 ක් 2003 මැයි 07 දිනැති අංක. NTC/POL/98/22 දරන ජාතික ගමනාගමන කොමිසමේ ලිපිය ප්‍රකාර ආදායම් ගිණුමට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

විෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය සහ විනය ක්‍රියාමාර්ගවලට භාජනය වූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.145,020 ක් වූ හිඟ හිටි ශේෂය ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කර හෝ නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

(i) සමාලෝචිත වර්ෂයේදී පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් පෙන්වා දුන් අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත්කළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් යාපනය දිස්ත්‍රික්කයේ පැවැති ග්‍රාම නිලධාරී කාර්යාල 435 ක පැවැති ගබඩා අයිතමයන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

පහත නිරීක්ෂණය කරනු ලැබේ. න ලද

කරෙයි නගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී පෞද්ගලික ඉඩමක ඉදිකර තිබුණි. කෙසේ වෙතත් මෙම ඉඩමෙහි හිමිකාරීත්වය මෙම වාර්තා කරන දින දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මාරු කරගෙන ගෙන නොතිබුණි. තවද, මෙම ගොඩනැගිල්ලෙහි 2015 දෙසැම්බර් 31 දිනට වූ ඓතිහාසික පිරිවැය/ පොත් අගය පරීක්ෂා කිරීම සඳහා සම්බන්ධිත ලිපිගොනුව විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මෝටර් වාහන 06 ක් වර්ෂ 04 සිට 05 දක්වා කාලයක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

## 3.8 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසි ප්‍රතිපාදනවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 115 | 924,950 | විධිමත් අධිකාරී බලයකින් තොරව පසුගිය වර්ෂයේ වියදම් සිදුකර ගෙන තිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් සතු වාහන 39 ක් සම්බන්ධයෙන් සෑම මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

**(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

## 3.9 දේශීය මූල්‍යයනය යටතේ වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

නියැදි විගණන පරීක්ෂණවලදී, අනාවරණය වූ ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේදී වූ ප්‍රමාදය පහතින් දැක්වේ.

(අ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකරනු ලැබූ මහල් හතරකින් යුක්ත පරිපාලන ගොඩනැගිල්ල පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 24.08 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අදියර VI නිම කළ යුතුව තිබූ ගොඩනැගිල්ල භෞතික වශයෙන් සියයට 90 ක් පමණක් අවසන් කර තිබුණි. මෙම ඉදිකිරීම් කටයුතු සඳහා සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර එම ඉදිකිරීම් ආරම්භ කළ වර්ෂයේ සිට රු.මිලියන 77.78 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 70.73 ක මුදලක් මෙම වාර්තාවේ දින වන විට වැය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රතිපාදන වෙන්කිරීම | වියදම |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 19,500,000 | 19,500,000 |
| 2012 | 5,000,000 | 4,958,478 |
| 2013 | 17,192,000 | 17,192,000 |
| 2014 | 12,000,000 | 12,000,000 |
| 2015 | 24,086,000 | 17,086,839 |
| | 77,778,000 | 70,737,317 |

**3.10** **කාර්යසාධනය**

**-------------------**

2015 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ගම් මට්ටමින් කමිටු පත්කිරීමට ආපදා කළමනාකරණ සේවා ඒකකය විසින් සැලසුම් කර තිබුණ ද සමාලෝචික වර්ෂයේදී ඒවා ඉටුකර නොතිබුණි.

**3.11** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ වලිකාවම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණෙන ජනතාවගේ බයිසිකල් හා යතුරුපැදි එම පරිශ්‍රයෙහි නවතා තැබීම වෙනුවෙන් වාහන නැවතුම් කුලියක් අය කිරීම සඳහා සේවක සුභ සාධන සංගමය විසින් අනවසර පුද්ගලයින් පත්කර ගනිමින් වසර 1 ½ කට වැඩි කාලයක සිට රු.2.00 සිට රු.10 දක්වා වූ මුදල් අයකර ගැනීමට ඉඩ සලසා තිබුණි. අදාල බලධාරීන් විසින් මෙම තත්ත්වය නියාමනය කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.12** **කළමනාකරණ දූර්වලතා**

**------------------------------**

පහත සඳහන් නිරීෂණය කරනු ලැබේ.

**කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**----------------------------------------**

අනලෙයිතිවු සෙට්ල්මන්ට් පාර (Analaitivu Settlement Road) නැවත සකස් කිරීම සඳහා පුද්ගලික ආයතනයකට එකතු කළ අගය මත බදු (VAT ) වශයෙන් රු. 415,900 ක් ගෙවා තිබුණි. එසේ වුවත්, එම එකතු කළ අගය මත බදු වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. අදාල ආයතනයේ VAT ලියාපදිංචි අංකය අක්‍රිය බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දැනුම්දීමෙන් අනතුරුව ඉහත ඉදිකිරීමට අදාල රඳවාගත් මුදලින් රු.194,087 ක් එකතු කළ අගය මත බදු වශයෙන් ආදායම් ගිණුමට මාරු කර තිබුණි. තවදුරටත් අයවිය යුතු රු. 221,813 ක VAT මුදල 2016 නොවැම්බර් 30 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.13** **පාඩු හා හානි**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විවිධ වූ කරුණු හේතුවෙන් වසර 14 සිට වසර 27 ක් දක්වා වූ කාලයක් රු.2,403,388 ක මුදලක් පාඩු ලෙස විසර්ජන ගිණුම්වල පෙන්වා තිබුණි. මෙය නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.14** **විසඳා නොතිබුණු විගණන ඡේද**

**----------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාලර්යාලයට අදාලව විගණකාධිපති වාර්කාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලට පසු විපරම් කටයුතු නිම නොකළ ඡේදවලට අදාල යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2013 | 1.14 | දිස්ත්‍රික් ලේකම්වරයා ඇතුළු නිලධාරීන් 27 දෙනෙකු සඳහා පුද්ගලික මඟී නාවුක සේවා කටයුතුවල නිරත වීම හේතුවෙන් ප්‍රසාද දීමනා ලෙස 2012 මැයි 02 දින රු.මිලියන 3.425 ක මුදලක් ගෙවා තිබුණි. 2009 මාර්තු මස වන විට මෙම නාවුක මඟී සේවාව නවතා දමා තිබුණද ඒ වන විටත් වැටුප්, අතිකාල හා වෙනත් දීමනාවලට අමතරව දිනකට රු.500 බැගින් ගෙවා තිබුණද මෙම නාවුක සේවා කටයුතුවලට අදාලව විශේෂ වූ කාර්යයක් කිසිදු නිලධාරියෙකු විසින් 2012 වර්ෂයේදී ඉටුකර නොතිබුණි. කෙසේ වුවද, 2015 ජූනි 29 දින සිට 2016 ඔක්තෝබර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.2,603,200ක මුදලක් පමණක් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හැකිවී ඇත. |
| 2013 | 1.11 (ආ) (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සිවිල් ඉංජිනේරුවරයෙකු සේවයේ යෙදී සිටියදී 2013 ජූනි 10 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත සම්මන්ත්‍රන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා කොන්ත්‍රාත් පදනම මත බාහිර නිලධාරීන දෙදෙනෙකු සේවයේ යොදවා ඇති අතර ඒ සඳහා පොදු තැන්පත් ගිණුමෙන් රු.180,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| 2014 | 3.4.2 | තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 නොවැම්බර් 14 දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන යටතේ රු.3,299,259 කට මහන මැෂින් 141 දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටු තීරණයට පටහැනිව මිලදී ගෙන තිබුණි. මේ සඳහා සැපයුම්කරුට රු. 479,400ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. වැඩියෙන් ගෙවූ මුදල අයකර ගැනීමට මේ වනතුරුත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 3.15 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 47 | 46 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 32 | 19 | 13 | - |
| (iii) | ද්විතියික මට්ටම | 954 | 1,013 | - | 59 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 225 | 194 | 31 | - |
| | **එකතුව** | **1,258** | **1,272** | **45** | **59** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සංවර්ධන නිලධාරීන් සහ  කළමනාකාර සහකාර නිලධාරීන් ලෙස බඳවාගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව 59 ක් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධිමත් අනුමැතිය ලබා ගැනීමට  දිස්ත්‍රික්  ලේකම් කාර්යාලය  අපොහොසත් වී තිබුණි.